

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පළාත් සභා හා පළාත් පාලන අංශය

කාර්යසාධන වාර්තාව - 2019

වියදම් ශීර්ෂය 155

පටුන

පරිච්ඡේදය 01- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	3-9
පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම	10-14
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	15-22
පරිච්ඡේදය 04– කාර්යසාධන දර්ශක	23
පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	24-26
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	26-28
පරිච්ඡේදය 07 – අනුකූලතා වාර්තාව	28-38

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ /ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

මෙම වාර්තාව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ පළාත් සභා හා පළාත් පාලන විෂය යටතේ 2019.01.01 දින සිට 2019.12.31 දක්වා ක්‍රියාත්මක වූ දේශීය හා විදේශීය ණය ආධාර ලබන ව්‍යාපෘති, ජාතික සංවර්ධන වැඩසටහන් සහ පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා වන ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ, සංශෝධනය කරන ලද නීති ආදිය පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඇතුළත් සවිස්තරාත්මක සාරාංශයකි.

ඒ අනුව එම කාලය තුළ පළාත් සභා සහ පළාත් පාලන ආයතනයන්හි (මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා) ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, රේඛීය අමාත්‍යාංශ හා අනෙකුත් ආයතන ඵලදායීව සම්බන්ධීකරණය කිරීම සිදුකර ඇත. තවද, පළාත් සභා සමඟ මනා සම්බන්ධීකරණයෙන් දිවයිනේ සෑම ප්‍රදේශයක ම දේශීය සහ විදේශීය ආධාර ලබන සංවර්ධන ව්‍යාපෘති සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදී.

2019 වර්ෂයේ දී රු.මිලියන 20,182.75 ක වටිනාකමකින් යුතු දේශීය සහ විදේශීය ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. සෞඛ්‍ය සහ අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, පළාත් සභා ග්‍රාමීය මාර්ග, ග්‍රාමීය පාලම්, පළාත් පාලන ආයතන කාර්යාල, බහුකාර්ය ගොඩනැඟිලි, සති පොළ, වෙළඳ සංකීර්ණ, ක්‍රීඩාංගන හා ළමා උද්‍යාන, වෛද්‍ය සායන මධ්‍යස්ථාන, ආයුර්වේද මධ්‍යස්ථාන බස් නැවතුම්පොළ, ජලාපවාහන පද්ධති, පානීය ජල යෝජනා ක්‍රම සහ සුසානභූමි ඉදිකිරීම එම ව්‍යාපෘති අතරින් කිහිපයකි. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මඟින් පළාත් සභා හා පළාත් පාලන ආයතනයන්හි නිලධාරීන් සඳහා පුහුණුව ලබා දෙමින් මානව සම්පත් සංවර්ධන ක්ෂේත්‍රය උදෙසා අඛණ්ඩව සහයෝගය ලබා දෙන ලදී.

පළාත් සභා හා පළාත් පාලන ක්ෂේත්‍රයෙහි මාර්ගෝපදේශ හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ අවධානය යොමු කිරීමට හැකිවීම අප විසින් දරන ලද ප්‍රශංසනීය ප්‍රයත්නයකි. ඒ අනුව, මිශ්‍ර නියෝජිත සමානුපාතික ක්‍රමය පළාත් සභා සඳහා හඳුන්වා දීම වැනි විශේෂ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගන්නා ලද අතර එය පාර්ලිමේන්තුව මඟින් සම්මත කර අමාත්‍ය මණ්ඩලය විසින් පනත කෙටුම්පත් කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. මුද්දර ගාස්තු සෘජුවම පළාත් පාලන ආයතන වෙත බැර කිරීමට හැකියාව ලැබෙන පරිදි නෛතික ප්‍රතිපාදන ඇතුළත් කරමින් පනත කෙටුම්පත් කරන ලද අතර පළාත් සභාවන්හි එකඟතාව ලබා ගැනීම සඳහා 2019 වර්ෂයේ දී යොමු කරන ලදී.

තවද, මෙම වාර්තාවේ ඉදිරි කොටස් වලින් 2019 වර්ෂයේ දී අමාත්‍යාංශයේ පළාත් සභා සහ පළාත් පාලන අංශයේ කාර්යසාධනය පිළිබඳ තවදුරටත් තොරතුරු ඉදිරිපත් කරයි.

අවසන් වශයෙන් ,2019 වර්ෂයේ දී අමාත්‍යාංශයේ අරමුණු සහ කාර්යයන් වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායීව ඉටුකරගැනීමට සඳහා ලද ගරු අමාත්‍යතුමාගේ මඟපෙන්වීම, ගරු රාජ්‍ය අමාත්‍යවරුන් ගේ අනුපමේය සහයෝගය සහ අමාත්‍යාංශ ලේකම්තුමාගේ, රාජ්‍ය ලේකම්තුමාගේ, අතිරේක ලේකම්වරුන්ගේ මෙන්ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ , පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ, ආයතන සහ විදේශ ආධාර ව්‍යාපෘතිවල අධ්‍යක්ෂවරුන්ගෙන් ලද මහඟු දායකත්වය විශේෂයෙන් සඳහන් කළ යුතුය.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

පළාත් සහ ප්‍රාදේශීය ආණ්ඩුකරණයක් සඳහා බලගැන්වීම

මෙහෙවර

ප්‍රජාවගේ සේවා ඉහළ ගුණාත්මකභාවයෙන් සපයන ඵලදායී, සහයෝගීත්ව, නව්‍යකරණ සහ වගවීමෙන් යුතු පළාත් සභා සහ පළාත් පාලන ක්‍රමයක් ඇති කිරීම.

අරමුණු

- පළාත් සභා සහ පළාත් පාලන ක්‍රමය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කිරීම
- පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට ඒවායේ බලතල භාවිතයෙන් සේවාවන් සැපයීම සඳහා ඒවායේ ශක්‍යතාව ඉහළ නැංවීම
- පළාත් සභා සහ පළාත් පාලන ක්‍රමය තුළ පිළිබිඹු වන ජනතා අභිලාෂය තහවුරු කිරීම
- පළාත් සභා, පළාත් පාලන ආයතන හා වෙනත් ආයතන සමග සම්බන්ධතා පවත්වමින් සියලු ප්‍රජාවන්ගේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරීම

1.3 ප්‍රධාන කාර්යයන්

2018.12.28 දිනැති අංක. 2103/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නව අමාත්‍යාංශවල විෂයයන් හා කාර්යයන් පිළිබඳ නිවේදනයට අනුව පළාත් සභා සහ පළාත් පාලන අංශයේ විෂයයන් හා කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

- පළාත් සභා සහ පළාත් පාලන විෂයයන්ට සහ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හා දේශීය ණය සංවර්ධන අරමුදල යන ආයතනයන්හි අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා අගැයීම.

- පළාත් සභාවලට අදාළ කටයුතු නියාමනය කිරීම

- පළාත් සභාවල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයන් පුහුණු කිරීම

- පළාත් පාලන ආයතනවලට අදාළ රජයේ කර්තව්‍යයන්

- පොදු පහසුකම් සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතනවලට ණය පහසුකම් ලබාදීම

- පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයන් පුහුණු කිරීම

- පළාත් සභා සහ පළාත් පාලන ආයතන පරිපාලනයෙහි සෑම මානයක් සම්බන්ධයෙන් ම පර්යේෂණ පැවැත්වීම

1.4. සංවිධාන සටහන

කරුණාකර ඇමුණුම 1 බලන්න.

1.5 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන / ප්‍රධාන අංශ

01. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය කාර්යාලය

02. පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍ය කාර්යාලය

03. ලේකම් කාර්යාලය

I. පළාත් පාලන ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය

II. පැමිණිලි හා තොරතුරු ඒකකය

04. පාලන අංශය

05. පළාත් සභා අංශය

06. පළාත් පාලන අංශය

07. සංවර්ධන අංශය

08. ව්‍යාපෘති අධීක්ෂණ අංශය

I. ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය

II. තොරතුරු තාක්ෂණ ඒකකය

09. ක්‍රමසම්පාදන අංශය

10. නීති අංශය

11. මූල්‍ය අංශය

12. වියදම් විමංසන අංශය

13. අභ්‍යන්තර විගණන අංශය

14. ජාතික සන අපද්‍රව්‍ය කළමනාකරණ සභායක මධ්‍යස්ථානය

15. දේශීය ණය සහ සංවර්ධන අරමුදල

16. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

17. මාධ්‍ය ඒකකය

1.6 අමාත්‍යාංශයට අරමුදල් සපයන ආයතන/ රටවල්

I. ශ්‍රී ලංකා රජය (GOSL)

II. ලෝක බැංකුව (WB)

III. ආසියානු සංවර්ධන බැංකුව (ADB)

IV. යුරෝපීය සංගමය (EU)

V. යුරෝපීය ආයෝජන බැංකුව (EIB)

VI. ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (JICA)

VII. එක්සත් රාජධානිය

VIII. නෙදර්ලන්තය

IX. ඔස්ට්‍රියාව

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අදාල වර්ෂය තුළදී විදේශ ආධාර ව්‍යාපෘති 15 ක් ක්‍රියාත්මක වූ අතර ඒවායේ මූලික තොරතුරු පහත සඳහන් පරිදි වේ.

අනු. අංකය	ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල (රු.මි)	ව්‍යාපෘති කාලය
1	මහකොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (GCWWMP)	ආසියානු සංවර්ධන බැංකුව (ADB)	14,657.00	2010 සැප්තැම්බර් - 2020 දෙසැම්බර්
2	මහකොළඹ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) 2 කොටස	ආසියානු සංවර්ධන බැංකුව (ADB)	1,396.00	2016 සැප්තැම්බර් - 2020 ජූනි
3	මහකොළඹ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) 3 කොටස	යුරෝපීය ආයෝජන බැංකුව (EIB) ආසියානු සංවර්ධන බැංකුව (ADB)	26,953.00	2016 නොවැම්බර්- 2020 දෙසැම්බර්
4	පළාත් පාලන ආයතන නහාසිටුවීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) – අතිරේක මූල්‍යයනය	ආසියානු සංවර්ධන බැංකුව (ADB)	10,184.00	2017 අප්‍රේල්- 2021 දෙසැම්බර්
5	ග්‍රාමීය පාලම් 618 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	එක්සත් රාජධානිය (UK)	22,600.00	2014 දෙසැම්බර් - 2019 සැප්තැම්බර්
6	ග්‍රාමීය පාලම් 250 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	එක්සත් රාජධානිය (UK)	11,163.98	2018 – 2020
7	ග්‍රාමීය පාලම් 490 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	නෙදර්ලන්තය	16,500.00	2014 දෙසැම්බර් - 2019 සැප්තැම්බර්
8	ග්‍රාමීය පාලම් 230 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	නෙදර්ලන්තය	10,356.73	2018 – 2020
9	ප්‍රථමික සෞඛ්‍ය සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය (PSSP)	ලෝක බැංකුව (WB)	23,852.00	2018 – 2023
10	සාමාන්‍ය අධ්‍යාපනය නව්‍යකරණ ව්‍යාපෘතිය (GEM)	ලෝක බැංකුව (WB)	15,505.00	2018 අප්‍රේල් - 2024 ජූලි

අනු. අංකය	ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල (රු.මි)	ව්‍යාපෘති කාලය
11	නැගී එන ප්‍රදේශවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP)	ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA)	21,186.00	2017 ජූලි- 2021 දෙසැම්බර්
12	ප්‍රවාහන සම්බන්ධක සහ වත්කම් කළමණාකරන ව්‍යාපෘතිය -පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (TCAMP- PRDP)	ලෝක බැංකුව (WB)	17,802.00	2019 මැයි - 2023 මාර්තු
13	නාගරික ව්‍යාපෘති සැලසුම් පහසුකම් සැපයීම	ආසියානු සංවර්ධන බැංකුව (ADB)	890.00	2019 – 2022
14	ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP)	ලෝක බැංකුව (WB)	17,947.00	2019 – 2022
15	ගිනි නිවන උපකරණ සැපයීම	ඔස්ට්‍රියාව	2,037.91	2019 ජනවාරි- 2020 දෙසැම්බර්

02 පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ

සැලසුම්ගත ඉලක්කය අනුව 2019 දෙසැම්බර් මස 31 දිනට සමස්ත මූල්‍ය ප්‍රගතියයෙහි ප්‍රතිශතය

2019 වර්ෂය සඳහා මුළු ප්‍රතිපාදන	=	රු. 20,182,750,000.00
2019 වර්ෂය සඳහා සත්‍ය වියදම	=	රු. 7,929,617,000.00
මූල්‍ය ජයග්‍රහණයෙහි ප්‍රතිශතයක් ලෙස	=	39.28%

2019 වර්ෂයේ දී දේශීය ආධාර ව්‍යාපෘතීන් හි ප්‍රගතිය

අංකය	ව්‍යාපෘතියේ නම	මූල්‍ය ඉලක්කය 2019/රු.(මිලියන)	මූල්‍ය ප්‍රගතියය/රු. (මිලියන)	භෞතික ප්‍රගතියය
1	ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය	1215.00	400.99	බොබ්කැට් යන්ත්‍ර 9 ක් හා ගලි බවුසර් 9 ක් සපයන ලදී
2	ඊ- පළාත් පාලන ආයතන (e LG) ව්‍යාපෘතිය	106.25	9.61	20%
3	පසුගාමී පළාත් පාලන ආයතන සඳහා සංවර්ධන සහයෝගය ආදායම් ජනනය කිරීමේ ව්‍යාපෘතිය	170.00	16.21	2%
4	අලුතින් සංස්ථාපනය කරන ලද පළාත් පාලන ආයතන වල යටිතල පහසුකම් නහාසිටුවීම	35.00	32.82	100%
5	මළාපවාහන පද්ධති ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කොළඹ මහ නගර සභාව ෂැංග්‍රිලා හෝටල් ව්‍යාපෘතිය සඳහා යටිතල පහසුකම් සැපයීම	400.00	299.36	100%
6	ග්‍රාමීය මාර්ග කි.මී. 1000 ක් සංවර්ධනය කිරීම	375.00	351.62	මාර්ග 69 ක්, බෝක්කු 2ක්, පැනිබැම් 1ක් අළුත් වැඩියා කර ඇත.
7	ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම (පුනරාවර්තන)	1200.00	161,89	මාර්ග 294ක්, කාණු 56ක්, මහජන වැසිකිළි 31ක්, සතිපොළ 26ක්, ළමා උද්‍යාන 20ක්, ජලසම්පාදන ක්‍රම 24ක්, බෝක්කුවක්, මහජන පුස්තකාල 4ක් අළුත් වැඩියා කර ඇත.

අංකය	ව්‍යාපෘතියේ නම	මූල්‍ය ඉලක්කය 2019/රු.(මිලියන)	මූල්‍ය ප්‍රගතියය/රු. (මිලියන)	භෞතික ප්‍රගතියය
8	පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම (මූලධන)	825.00	161.89	මාර්ග 132ක්, කාණු 3ක්, පැති බැමි 3ක්, හා ක්‍රීඩාපිටියක්, සතිපොළක්, මහජන වැසිකිළියක් හා කොම්පෝස්ට් අංගනයක් අළුත් වැඩියා කර ඇත.
9	වන්දනාකරුවන් සඳහා විවේකාගාර ස්ථාපනය (පහසු මධ්‍යස්ථාන 4 ක් ඉදිකිරීම)	75.00	7.50	50%
10	පළාත් පාලන ආයතන පුස්තකාල සංවර්ධනය	20.63	8.50	100%
11	මඩකලපුව මහනගර සභාවේ මහඩන පුස්තකාලය ඉදිකිරීම	85.00	0.14	-
12	‘‘අම්මච්චි’’ සංකල්පය ක්‍රියාත්මක කිරීම	19.30	16.81	100%
13	පළාත් පාලන ආයතන සඳහා කසළ රැස් කරන කම්පැක්ටර් රථ ලබා දීම	1280.00	-	කම්පැක්ටර් රථ 100 ක් බෙදා දෙන ලදී
14	යුනිසෙෆ් ආධාර වැඩසටහන	50.00	35.92	-
15	පළාත් පාලන ආයතන සඳහා දත්ත සංචිතයක් ස්ථාපනය කිරීම	2.50	-	-

ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ ජනතාවගේ ජීවන තත්වයේ නංවාලීම් අරමුණු කර ගත් විවිධ වර්ගයේ විශේෂ සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය කර, අරමුදල් අදාළ පළාත් සභාවලට නිකුත් කරන ලදී. එම සංවර්ධන වැඩසටහන් වන්නේ;

1. ආහාර නිෂ්පාදන වැඩසටහන
2. දරුවන් සුරැකීමේ වැඩසටහන
3. විශේෂ අවශ්‍යතාසහිත පුද්ගලයන් සහ වැඩිහිටි ප්‍රජාව සවිබලගැන්වීමේ වැඩසටහන
4. තිරසර පාසැල් සංවර්ධන වැඩසටහන
5. පරිසර සංරක්ෂණ වැඩසටහන
6. ජාතික මත් ඌවදුර දුරලීමේ සතිය

විවෘත රාජ්‍ය භවුල්කාරිත්වයේ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ දෙවන අදියර යටතේ බස්නාහිර පළාතේ තෝරාගත් ප්‍රාදේශීය සභා හයක පුරවැසියන්ගේ සහභාගීත්වයෙන් පළාත් පාලන ආයතනවල නෛතික පසුබිම ස්ථාපිත කිරීමේ නියමු වැඩසටහනක් ආරම්භ කරන ලදී.

දිවයිනෙහි ඕනෑම පළාත් පාලන ආයතනයක් විසින් සපයනු ලබන සේවාවන් පිළිබඳව සෑහීමකට පත් නොවන අවස්ථාවකදී, මහජනතාවගෙන් ලැබී ඇති එබඳු පැමිණිලි යොමු කිරීම සඳහා පළාත් පාලන අංශයට අනුයුක්තව විමර්ශන ඒකකයක් 2019 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ජනතාවගෙන් ලද එවැනි පැමිණිලි 642 ක් අදාළ පළාත් වෙත යොමු කොට සුදුසු පරිදි විසඳුම් ලබා දෙන ලදී. තවද පෙත්සම් 12 ක් සහ පෙත්සම් 6 ක් පිළිවෙලින් මහජන පෙත්සම් කාරක සභාවට සහ උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරන ලදී.

නව පළාත් පාලන ආයතන සංස්ථාපනය / උත්ශ්‍රේණිගත කිරීම යටතේ 2019 මුල් භාගයේදී, නියමිත නිර්ණායක සමාලෝචනය කිරීම සහ අවශ්‍ය වෙනස් කිරීම් උදෙසා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා උපදෙස් සැපයීමට පළාත් මට්ටමේ රැස්වීම් ආරම්භ කරන ලදී. මේ වන විට මෙම අමාත්‍යාංශය වෙත එම නිර්දේශිත යෝජනා ලැබෙමින් පවතී.

ආදායම් උත්පාදනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතනවලට ණය පහසුකම් ලබා දීමේදී, දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF) විසින් 2019 වර්ෂය තුළ රුපියල් මිලියන 652.83 ක් වටිනා ණය පහසුකම් 17 ක් ලබා දී ඇත.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG) පළාත් සභා සහ පළාත් පාලන නිලධාරීන් සඳහා දේශීය පුහුණු / වැඩමුළු 293 ක් පවත්වා ඇති අතර එම පුහුණු / වැඩමුළු සඳහා නිලධාරීන් 11,614 ක් සහභාගී වී තිබේ. මීට අමතරව, අමාත්‍යාංශයේ විවිධ මට්ටම් නියෝජනය කරන නිලධාරීන් 43 දෙනෙකු 2019 වර්ෂයේදී විදේශීය පුහුණුව සඳහා සහභාගී වූහ. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පර්යේෂණ අංශය විසින් පළාත් පාලන ක්ෂේත්‍රය සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන අතර සම්බන්ධතාවය නමින් පර්යේෂණ අධ්‍යයන සිදු කර ඇත. මෙම අධ්‍යයන දෙකෙහිම වාර්තා මේ වන විට කෙටුම්පත් කර තිබේ.

2019 වර්ෂයේ දී විදේශ ආධාර ව්‍යාපෘතිවල ප්‍රගතිය

අංකය	ව්‍යාපෘතියේ නම	මූල්‍ය ඉලක්කය / රු (මී.)	මූල්‍ය ප්‍රගතියය රු. (මී)	භෞතික ප්‍රගතියය
1	මහකොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (GCWWMP)	1500.00	1445.84	සමුච්චිත ප්‍රගතිය - 83.7 %
2	මහකොළඹ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) 2 කොටස	500.00	355.25	සමුච්චිත ප්‍රගතියය 31 %

අංකය	ව්‍යාපෘතියේ නම	මූල්‍ය ඉලක්කය / රු (මී.)	මූල්‍ය ප්‍රගතියය රු. (මී)	භෞතික ප්‍රගතියය
3	මහකොළඹ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) 3 කොටස	2800.00	1247.54	සමුච්චිත ප්‍රගතිය - 26.5 %
4	පළාත් පාලන ආයතන නඟාසිටුවීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) – අතිරේක මූල්‍යයනය	2676.20	2352.24	සෞඛ්‍ය මධයස්ථාන 1, වෙළඳ මධ්‍යස්ථාන 1, සති පොළ 1, මහජන පුස්තකාල 2, ශ්‍රවණාගාර 1, පළාත් පාලන ආයතන කාර්යාල 6 ඉදිකිරීම් නිම කර ඇත.
5	ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (අදියර 2 සහ 2c)	675.80	389.38	පාලම් 48 ක් ඉදි කිරීම නිම කර තිබේ.
6	ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය(අදියර 3 සහ 3c)	1625.33	206.53	පාලම් 71ක් ඉදි කිරීම නිම කර තිබේ.
7	ප්‍රථමික සෞඛ්‍ය සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය (PSSP)	1380.00	1145.00	2019 වර්ෂයේ දී ප්‍රගතියය - 5 % සමුච්චිත ප්‍රගතිය - 5 %
8	සාමාන්‍ය අධ්‍යාපනය නව්‍යකරණ ව්‍යාපෘතිය (GEM)	1680.00	-	-
9	නැඟී එන ප්‍රදේශවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය ((RIDEP)	980.00	318.08	2019 වර්ෂයේ දී ප්‍රගතියය - 5 % සමුච්චිත ප්‍රගතියය - 7 %
10	ප්‍රවාහන සම්බන්ධක සහ වත්කම් කළමණාකරන ව්‍යාපෘතිය -පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (TCAMP- PRDP)	520.00	100.70	2019 වර්ෂයේ දී ප්‍රගතියය - 2 % සමුච්චිත ප්‍රගතියය - 2 %
11	නාගරික ව්‍යාපෘති සැලසුම් පහසුකම් සැපයීම	300.00	52.22	2019 වර්ෂයේ දී ප්‍රගතියය - 60 % සමුච්චිත ප්‍රගතියය - 60 %
12	දේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP)	300.00	282.40	කොට්ඨාස මට්ටමෙන් අවශ්‍යතා තක්සේරු සැලසුම් 1582 සකස් කළ අතර පළාත් පාලන සංවර්ධන සැලසුම් 134 ක් (LAPDPs) සකස් කරන ලදී
13	ගිනි නිවන උපකරණ සැපයීම	350.00	-	2019 වර්ෂයේ දී ප්‍රගතියය - 35 % සමුච්චිත ප්‍රගතියය – 35%

අභියෝග:

අමාත්‍යාංශයේ පළාත් සභා සහ පළාත් පාලන අංශය යටතේ 2019 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම්වල අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා දේශීය හා විදේශීය ආධාර ව්‍යාපෘති සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන නිසිපරිදි නොලැබීම.

ඉදිරි ඉලක්ක

i. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම මඟින් ප්‍රදේශීය සභාවල ප්‍රජා යටිතල පහසුකම් සඳහා වැය වන වාර්ෂික නඩත්තු පිරිවැය 50% කින් අඩු කිරීම.

ii. ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග වල ප්‍රමාණයෙන් කිලෝමීටර් 1000 ක් ඉදිකිරීමේ වැඩසටහන ක්‍රියාත්මකකිරීම මඟින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය මාර්ග ජාලයේ මුළු දිගින් 1.2% ක් සංවර්ධනය කිරීම.

iii. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් පළාත් පාලන ආයතනවල ආදායම 10% කින් වැඩි කිරීම.

iv. පළාත් පාලන ආයතන පුස්තකාලය ක්‍රියාත්මක කිරීමෙන් ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල මහජන පුස්තකාලවලින් 30% ක් ස්වයංක්‍රීය කිරීම.

v. පුරනැගුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් රට තුළ නිදන්ගත වකුගඩු රෝගය (CKD) වර්ධනය වන අනුපාතය අඩු කිරීම සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල ආයු අපේක්ෂාව වැඩි කිරීම.

vi. නැඟී එන පළාත්වල ග්‍රාමීය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් හඳුනාගත් ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම, පානීය ජලය සැපයීම සහ කුඩා සහ මධ්‍යම පරිමාණ වාරිමාර්ග යටිතල පහසුකම් ඉහළ නැංවීම. හඳුනාගත් ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම හා වැඩිදියුණු කිරීම, පානීය ජලය සැපයීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

vii. පවුල් 10,000 ක් සඳහා සුරක්ෂිත පානීය ජල සම්බන්ධතා ඇති කිරීම.

viii. TCAMP ව්‍යාපෘතිය මගින් මාර්ග ජාලය වැඩිදියුණු කිරීම තුළින් පළාත තුළ අභ්‍යන්තර සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම.

ix. ප්‍රථමික සෞඛ්‍ය සේවා භාවිතය හා එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම.

x. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල නිලධාරීන්ගේ දැනුම, කුසලතා සහ අත්දැකීම් වැඩි දියුණු කිරීම.

xi. ආදායම් උත්පාදන ව්‍යාපෘති තුළින් ව්‍යාපාර කටයුතු වැඩිදියුණු කිරීම සහ පළාත් පාලන ආයතනවල මූල්‍යමය ධාරිතාවය ශක්තිමත් කිරීම.

xii. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රජාවගේ සංචලතාව වැඩි කිරීම සහ ජීවන මට්ටම ඉහළ නැංවීම.

xiii. LDSP ව්‍යාපෘතිය මගින් ප්‍රජාවන්ට සේවා සැපයීම සඳහා පළාත් පාලන ආයතනවල හැකියා ශක්තිමත් කිරීම.

xiv. පළාත් පාලන ආයතන පරිපාලන ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම.

.....

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී

S. Hettiarachchi
Secretary
Ministry of Public Administration, Home Affairs
Provincial Council & Local Government
No. 330, Union Place,
Colombo 02.

දිනය :22/02/2020

03 පරිච්ඡේදය - වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

අයවැය (වර්තමාන වර්ෂය)		සටහන	තත්‍ය වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	ආදායම් බදු දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	**ඒසීඒ-1**
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් සහ වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍ර		206,135,048,550	188,807,144,488	**ඒසීඒ-3**
-	තැන්පතු		115,766,741	296,684,039	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		11.929,282	13,109,349	**ඒසීඒ-5/5(අ)**
-	වෙනත් ලැබීම්		86,542,529	51,546,050	**5(ආ)**
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**206,349,287,103**	**189,168,483,926**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ= (අ) +(ආ)**		**206,349,287,103**	**189,168,483,926**	
	අඩුකළා: වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
-	වේතන, වැටුප් සහ වෙනත් සේවක ප්‍රතිලාභ	**5**	159,076,348	146,443,556	**ඒසීඒ-2(ii)**

-	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	93,339,585	99,652,515	
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	200,911,590	676,697,756	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	30,000	50,000	
-	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**453,357,523**	**922,843,827**	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණුකිරීම්	**10**	6,700,590	14,850,061	
	මූලධන වත්කම් අත්පත්කරගැනීම	**11**	1,539,628	5,824,842	
-	ප්‍රකාශ්ධන පැවරීම්	**12**	754,186,674	2,087,955,389	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත්කරගැනීම්	**13**	335,307,126	309,355,433	
-	හැකියා වර්ධනය	**14**	1,654,430	1,785,486	
-	වෙනත් මූලධන වියදම්	**15**	6,376,870,734	11,719,867,708	
-	**මුළු මූලධන වියදම් (ඉ)**		**7,476,259,180**	**14,139,638,919**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**218,731,650**	**155,569,915**	
	තැන්පතු ගෙවීම්		199,222,093	136,179,909	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		19,509,558	19,390,006	**ඒසිඒ-5/5(අ)** **5(ආ)**
	මුළු වියදම උ (ඇ+ඉ+ඊ)		**8,148,348,354**	**15,218,052,661**	
-	**..... දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**		**198,200,938,749**	**173,950,431,265**	

3.2 අග්‍රිම ගැළපුම් ප්‍රකාශය

අග්‍රිම ගැළපුම් ගිණුම

රු.

මෙම අංශය වෙනුවෙන් වෙනත් වැය ශීර්ෂ මඟින් රැස් කරන ලද මුදල්	-	**මෙම අංශය වෙනුවෙන් වෙනත් වැය ශීර්ෂ මඟින් සිදු කරන ලද ගෙවීම්**	
		අත්තිකාරම් බී ගිණුම Dr 012	4,027,051
		සෘජු ගෙවීම්	5,027,176,771
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් කරන ලද ගෙවීම්		**වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් රැස් කරන ලද මුදල්**	
අත්තිකාරම් බී ගිණුම – Cr (012)	2,849,455		
පළාත් සභා හා වෙනත් ආයතන සඳහා ගෙවීම්	203,216,593,100		
ප්‍රධාන ලෙජර් ගෙවීම්		**ප්‍රධාන ලෙජර් ලැබීම්**	
		නිරවුල් නොකළ අග්‍රිම ගිණුම	198,188,238,733
	203,219,442,555		203,219,442,555

නිරවුල් නොකළ අග්‍රිම ගිණුම

රු.

		මූල්‍ය කාර්ය සාධනය අනුව ශේෂය	198,200,938,748.91
අග්‍රිම ගැලපුම් ගිණුම	198,188,238,733.34		
2019.12.31 දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට පියවන ලද අග්‍රිම ශේෂය	12,700,015.57		
	198,200,938,748.91		198,200,938,748.91

3.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

ඒසීඒ-පී

2019 දෙසැම්බර් මස **31** වන දිනට මුදල් ප්‍ර කාශනය

	සටහන	තත්‍ය	
		වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	**ඒසීඒ-6**	510,937,219.88	509,397,592.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	**ඒසීඒ-5/5(අ)**	46,176,422.38	38,596,147.00
මුදල් හා මුදල් සමාන දෑ	**ඒසීඒ-3**	-	-
මුළු වත්කම්		**557,113,642.26**	**547,993,739.00**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරයට ශුද්ධ මුදල		(168,079,121,51)	(259,114,749.00)
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		510,937,219.88	509,397,592.00
කුළී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ5(ආ)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	**ඒසීඒ-4**	214,255,543.89	297,710,895.00
අග්‍රිම ශේෂය	**ඒසීඒ-3**	-	-
මුළු වගකීම්		**557,113,642.26**	**547,993,738.00**

පිටු අංක... සිට ... දැක්වෙන ඉහත ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..... සිට .... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛයා , ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛයා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

S. Hettiarachchi
Secretary
Ministry of Public Administration, Home Affairs,
Provincial Council & Local Government
No. 330, Union Place,
Colombo 02.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මූල්‍ය) / කොමසාරිස් මූල්‍ය

M.W.A.R.P. Wijesinghe
Chief Financial Officer
Ministry of Internal & Home Affairs and
Provincial Councils & Local Government
No. 330, Union Place, Colombo 02,

දිනය: 27.02.2020

3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-සි

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

..... දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍ර වාහ ප්‍රfකාශය

	තත්‍ය	
	2019	**2018**
	රු.	රු
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර ලාභ	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	59,548,240	52,607,654
වෙනත් ශීර්ෂ සඳහා ඒකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	206,135,048,550	189,051,220,873
මෙහෙයුම් ක්‍රිකාරකම්වලින් ජනිත මුළු මුදල් ප්‍රමාණය (අ)	**206,194,596,790**	**189,103,828,527**
අඩු කළා - මුදල් වැය කිරීම් :		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	285,113,356	5,490,660,553
සහනාධාර හා මාරුකිරීම් වියදම්	141,574,164	136,179,909
වෙනත් ආයතන සඳහා අග්‍රිම	468,339,333	
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	202,617,474,280	183,466,663,082
භණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	12,700,016	1,191,275
මෙහෙයුම් ක්‍රියාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය (ආ)	**203,525,201,150**	**189,094,694,819**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ) –(ආ)	**2,669,395,640**	**9,133,708**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
පොළිය	-	-
ලාභාංශ	-	-

හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදනහා හෞතික වත්කම්විකිණීම	121,705	-
උප ණය අයකරගැනීම්	-	-
අත්තිකාරකම් අයකරගැනීම්	1,164,105	10,042,696
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**1,285,810**	**10,042,696**
<u>අඩු කළා - මුදල් වැය කිරීම :</u>		
හෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත්	2,494,931,879	
වෙනත් ආයෝජන අත්පත්කර ගැනීම්	15,482,507	19,176,404
අත්තිකාරම් ගෙවීම්	**2,510,414,385**	**19,176,404**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ඉ)	**(2,509,128,576)**	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඇ) - (ඉ)		**(9,133,708)**
	160,267,064	**-**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රි යාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ) + (ඊ)		
<u>මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>	-	-
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	24,008,893	-
තැන්පතු ලැබීම්	**24,008,893**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		
<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>	-	-
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	184,275,957	-
තැන්පතු ගිණුම් වෙනස්වීම සහ වෙනත් වගකීම්	**184,275,957**	**-**
ප්‍රවාහය මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් (එ)		
	(160,267,064)	**-**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඒ)= (ඌ)-(එ)		

	(0)	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) =(උ)-(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		

3.5 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

ඇමුණුම් අංක 2 හි ඇතුළත් කර ඇත.

3.6 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		රැස් කළ ආදායම	
		මුල් ඇස්තමේන්තුව	සංශෝධිත ඇස්තමේන්තුව	මුදල (රු.)	සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව % ලෙස
-	-	-	-	-	-

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදනඋපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

Rs. ,000

ප්‍රතිපාදනවර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය විදම	උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදනඅවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	1,511,050	1,510,550	453,358	30%
ප්‍රාග්ධන	17,907,000	18,672,200	7,476,259	40%

3.8 මූලා්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	2019.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2019.12.31 දිනට මූල්‍ය තත්වය වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කණයට නියමි	ප්‍රගතියය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යූහයන්	10,000	10,000		
9152	යන්ත්‍රෝපකරණ	493,937	493,937		
9153	ඉඩම්	7,000	7,000		
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		
9160	කෙරීගෙන යන වැඩ	-	-		
9180	බදු දෙන ලද වත්කම්	-	-		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

** පාර්ශ්වකරුවන්ට ඉදිරිපත් කිරීමේ දී විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (scan) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩබ්ලිව්එන්පී2/සීබී/එච්/එම්පීසීඑල්ජී/එෆ්ඒ /2019

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2020 ජූනි 26 දින

අධ්‍යක්ෂ ජනරාල්,

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව



ශීර්ෂය - 155

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

මුල් පිටපත සහ භාෂාත්‍රයෙන් මූල්‍ය ප්‍රකාශන මේ සමඟ ඉදිරිපත් කර ඇත.

ආර්.පී.සුනන්දා පත්මිණී,

සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

පිටපත : ලේකම් - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය. ✓ EP 4

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
+94 11 2 88 70 28 - 34

இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	ඩබ්ලිව්එන්පී2/සීබී/එච්/ එම්පීසීඑල්ජී/එෆ්ඒ/2019	ඔබේ අංකය உமது இல. Your No.	දිනය திகதி Date	2020 ජූනි 26 දින

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

1.4 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
1.6.2	මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂය තුළ අත්පත් කර ගත් වත්කම් රු. මිලියන 3.75 ක් වූ අතර වර්ෂය තුළ අත්පත් කර ගත් වත්කම් හා වෙනත් මූලධන වියදම රු.මිලියන 12,049.90 ක් විය. ඒ අනුව රු.මිලියන 12,046.15 ක වෙනසක් නිරීක්ෂණය විය.	අමාත්‍යාංශය විසින් පළාත් සභා හා පළාත් පාලන ආයතනය වෙනුවෙන් සිදුකරන මූලධන වියදම් සම්බන්ධව විධිමත් වත්කම් පැවරීමක් කළ යුතුය.
1.6.5	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහයේ මූදල් රෙගුලාසි 702(3)	මූදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

(අ) භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශ අනුව මුළු පුනරාවර්තන වියදම රු.මිලියන 9,027.80 ක් වී තිබුණත්, එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.මිලියන 3.33ක් වැඩියෙන් රු.මිලියන 9,031.13ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 3.33 කින් අඩු වී තිබුණි.

(ආ) 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සංඛ්‍යා භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශවල සඳහන් සංඛ්‍යා පදනම් කරගෙන පිළියෙල කළ යුතුව තිබුණි. නමුත් 2019 වර්ෂයේදී භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශය අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.මිලියන 443.83 ක් හා රු.මිලියන 1,810.62 ක් විය යුතුව තිබුණත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පිළිවෙලින් රු.මිලියන 4.17 ක් වැඩියෙන් හා රු.මිලියන 23.77 ක් අඩුවෙන් පිළිවෙලින් රු.මිලියන 448.00 ක් හා රු.මිලියන 1,786.85 ක් වශයෙන් දක්වා තිබුණි.

(ඇ) 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සංඛ්‍යා භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශවල සඳහන් සංඛ්‍යා පදනම් කරගෙන පිළියෙල කළ යුතුව තිබුණි. නමුත් 2019 වර්ෂයේදී භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශය අනුව තැන්පත් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.මිලියන 124.25 ක් හා රු.මිලියන 207.31 ක් විය යුතුව තිබුණත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පිළිවෙලින් රු.මිලියන 6.39 ක් හා රු.මිලියන 6.39 ක් අඩුවෙන් පිළිවෙලින් රු.මිලියන 117.86 ක් හා රු.මිලියන 200.92 ක් වශයෙන් දක්වා තිබුණි.

(ඈ) 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(ii) ඡේදය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු කරන ලද ආදායම් වෙනත් ලැබීම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දැක්විය යුතුව තිබුණි. අමාත්‍යාංශයේ ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන්ට අදාළ ආදායම් සංකේත 09 ක් යටතේ අමාත්‍යාංශය එකතු කළ ආදායම රු.මිලියන 78.23ක් වී තිබුණි. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම ලැබීම රු.මිලියන 8.31ක් වැඩියෙන් රු.මිලියන 86.54 ක් ලෙස දක්වා තිබුණි.

(ඉ) චක්‍රලේඛයේ 3.5 ඡේදය අනුව එක් එක් වැය විෂය සංකේතයක් යටතේ සෑම වැය විෂයක් වෙනුවෙන්ම මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර වෙනස හා මෙම වෙනස මුළු ප්‍රතිපාදනයෙන් සියයට 5 හෝ රුපියල් 10,000 යන දෙකෙන් කවර හෝ වැඩි මුදලට වඩා වැඩි වන්නේ නම් ඉදිරිපත් කළ යුතු හේතු ඒසිඒ2 II හි පෙන්විය යුතු වුවත් වැය විෂය සංකේත 112 ක ප්‍රතිපාදන නියමිත සීමාවට වැඩියෙන් ඉතිරි වී තිබියදී හේතු දක්වා ඒසිඒ2 II ආකෘතිය ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) චක්‍රලේඛයේ 6 වන ඡේදයේ දක්වා ඇති පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිත කළ යුතු ආකෘති අංක ඒසිඒ 2 III මගින් ඉදිරිපත් කළ යුතු මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර විචලතාව පැහැදිළි කිරීම සිදු කර නොතිබුණි.

1.5.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

(අ) 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් සංඛ්‍යා භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශවල සඳහන් සංඛ්‍යා පදනම් කර ගත යුතුව තිබුණි. භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ අනුව දේපළ, පිරියත හා උපකරණවල 2019 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.මිලියන 1,496.23 ක් වී තිබුණත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එම වටිනාකම රු.මිලියන 509.40 ක් අඩුවෙන් රු.මිලියන 986.83 ක් වශයෙන් දක්වා තිබුණි.

(ආ) ඉහත චක්‍ර ලේඛයේ 7(v) ඡේදය ප්‍රකාරව ශුද්ධ වත්කම්වල වටිනාකම් ලබා ගත යුතු ආකාරය අනුව කටයුතු නොකිරීම් නිසා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සඳහන් ශුද්ධ වත්කම් වටිනාකම් රු.මිලියන 0.92 ක් අඩුවෙන් රු.මිලියන 1,190.00 ක් ලෙස දක්වා තිබුණි.

1.5.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(අ) අමාත්‍යාංශයේ ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම් අනුව වෙනත් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම රු.මිලියන 78.10ක් වී තිබුණත්. එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ රු.මිලියන 7.47 ක් වැඩියෙන් රු.මිලියන 85.57 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව පෞද්ගලික පඩිනඩි හා මෙහෙයුම් වියදම්, සහනාධාර හා මාරුකිරීම් සහ වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම් පිළිවෙලින් රු.මිලියන 3,258.58 ක්. රු.මිලියන 163.51 ක් හා රු.මිලියන 202,661.96 ක් වී තිබුණි. නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වෙතුවෙන් වැය කළ මුදල් ප්‍රවාහයේ පිළිවෙලින් රු.මිලියන 2,566.60 ක්, රු.මිලියන 21.04 ක් හා රු.මිලියන 16.86ක් අඩුවෙන් පිළිවෙලින් රු.මිලියන 691.98 ක්, රු.මිලියන 142.47 ක් හා රු.මිලියන 202,645.09 ක් වශයෙන් දක්වා තිබුණි. මේ නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතුවෙන් වැය කළ මුදල් ප්‍රවාහය රු.මිලියන 2,604.50 ක් අඩුවෙන් රු.මිලියන 203,492.24 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් අයකර ගැනීම රු.මිලියන 47.95 ක් වී තිබුණත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ එම වටිනාකම රු.මිලියන 24.84 ක් අඩුවෙන් රු.මිලියන 23.11 ක් වශයෙන් දක්වා තිබුණි.

(ඈ) ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් ගෙවීම හා භෞතික වත්කම් අත්පත් කර ගැනීම සඳහා පිළිවෙලින් රු.මිලියන 66.93 ක් හා රු.මිලියන 13.58 ක් වැය කර තිබුණත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වෙතුවෙන් වැය කළ මුදල් ප්‍රවාහයේ එම වටිනාකම් පිළිවෙලින් රු.මිලියන 15.70 ක් අඩුවෙන් හා රු.මිලියන 2,526.02 ක් වැඩියෙන් පිළිවෙලින් රු.මිලියන 51.23 ක් හා රු.මිලියන 2,539.60 ක් වශයෙන් දක්වා තිබුණි.

(ඉ) ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව තැන්පත් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.මිලියන 124.08ක් හා රු.මිලියන 207.14 ක් වී තිබුණි. නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය අනුව තැන්පත් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.මිලියන 91.96 ක් හා රු.මිලියන 15.15 ක් අඩුවෙන් පිළිවෙලින් රු.මිලියන 32.12ක් හා රු.මිලියන 191.99 ක් වශයෙන් දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙහෙයුම් කාර්යයන් හා සංවර්ධන කාර්යයන් යටතේ පුනරාවර්තන වැය විෂයයන් 20කට අදාළ මුළු ප්‍රතිපාදනය වන රු.මිලියන 1,256.52න් රු.මිලියන 1,064.96ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 84.75ක් විය. ඒ අනුව වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේදී මුදල් රෙගුලාසි 50 මගින් අවධාරණය කර ඇති කරුණු පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

(ආ) මෙහෙයුම් කාර්යයන් හා සංවර්ධන කාර්යයන් යටතේ ප්‍රාග්ධන වැය විෂයයන් 16කට අදාළ මුළු ප්‍රතිපාදනය වන රු.මිලියන 5,181.96ම මුළුමනින් ම ඉතිරි වී තිබුණි.

(ඇ) මෙහෙයුම් කාර්යයන් හා සංවර්ධන කාර්යයන් යටතේ ප්‍රාග්ධන වැය විෂයයන් 42කට අදාළ මුළු ප්‍රතිපාදනය වන රු.මිලියන 8,937.45ක් වූ අතර ඉන් රු.මිලියන 6,170.74ක් ඉතිරි වී තිබුණු අතර එය ප්‍රතිශතයක් වශයෙන් සියයට 69.04ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන මාරු කිරීම් රු.මිලියන 754.19ක් ලෙස දක්වා තිබුණ ද වර්ෂයේ සත්‍ය ප්‍රාග්ධන මාරුකිරීම් රු.මිලියන 23.96ක් විය. එම වියදම 155-1-2-2201 යටතේ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට සිදු කළ මාරු කිරීම් වේ. ප්‍රාග්ධන මාරු කිරීම් නොවන මූලධන වියදම් ප්‍රාග්ධන මාරු කිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඉ) 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ 6 ඡේදය ප්‍රකාර ඒසිඒ -2(i) ආකෘතියේ පුනරාවර්තන වියදම් යටතේ අනෙකුත් භාණ්ඩ හා සේවා ලෙස රු.මිලියන 617.59 ක් සඳහන් කර තිබුණ ද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.මිලියන 565.60 ක් වූයෙන් රු.මිලියන 51.99ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) ඉහත චක්‍රලේඛය ඒසිඒ -2(i) ආකෘතියේ වෙනත් පුනරාවර්තන වියදම් ලෙස රු.30,000ක් සඳහන් කර තිබුණ ද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ රු.මිලියන 52.02 ක් වූයෙන් රු.මිලියන 51,99ක වෙනසක් නිරීක්ෂණය විය.

(උ) ඉහත චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරිපත් කර ඇති ආකෘතිවල සඳහන් සංඛ්‍යා හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් සංඛ්‍යා සමග සැසඳීමේදී පහත සඳහන් ආකාරයේ වෙනස්කම් නිරීක්ෂණය විය.

i. ඒසිඒ-05 ආකෘතිය අනුව 2019 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ලැබීම් රු.මිලියන 442.84ක් වූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් අයකර ගැනීම් රු.මිලියන 23.11ක් වූයෙන් රු.මිලියන 419.73ක වෙනසක් නිරීක්ෂණය විය.

ii ඒසිඒ-5 ආකෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මුදලින් හර කිරීම් රු.මිලියන 1,809.63ක් ලෙස දක්වා තිබුණ ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් රු.මිලියන 51.23 ක් වූයෙන් රු.මිලියන 1,758.40ක වෙනසක් නිරීක්ෂණය විය.

iii ඒසිඒ-6 ආකෘතියේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම් හෝ වෙනත් ආයෝජන අත්කර ගැනීම් වටිනාකම රු.මිලියන 13.02ක් ලෙස සඳහන් කර තිබුණ ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.මිලියන 2,539.59 ක් වූයෙන් වෙනස රු.මිලියන 2,526.57ක් විය.

2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3 අවිධිමත් ගනුදෙනු

විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ප්‍රසම්පාදන තීරණයක් ගෙන මුදල් රෙගුලාසි 137 (1), (2), (3), (4) හා 138හි විධිවිධාන පිළිබඳ සැලකිල්ලක් නොදක්වා "ඊ-පළාත් පාලනය" ව්‍යාපෘතියේ සහායක හා නඩත්තු සේවා සඳහා පුද්ගලික සමාගමකට රු.මිලියන 3.45ක් ගෙවා තිබුණි.

ආර්.පී.සුනන්දා පත්මිණි,
සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

04 පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	**75%-89%**	**50%-74%**
1	පළාත් සභා හා පළාත් පාලන මට්ටමෙන් පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වන ලද මහජන නියෝජිතවරුන් සහ නිලධාරීන් සංඛ්‍යාව	**100**		
2	පළාත් පාලන සේවා වැඩිදියුණුකිරීම සඳහා අමාත්‍යාංශ අයවැය මඟින් ප්‍රදාන ලද පළාත් පාලන ආයකන සංඛ්‍යාව (පළාත් පාලන ප්‍රෙද්ශ)	**100**		
3	අමාත්‍යාංශය මඟින් ලද වාර්ෂික ප්‍රතිපාදනඋපයෝගීකිරීමේ ප්‍රතිශතය			**39.28**
4	‘‘සණ අපද්‍රව්‍ය කළමනාකරණ වාර්ෂික සැලසුම්‘‘ සකස් කර ක්‍රියාත්මක කරන ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව (අපද්‍රව්‍ය රැස් කිරීම / කොම්පෝස්ට්කරණය/ ප්‍රතිචක්‍රීකරණ.....)		**80**	
5	දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය ස්ථාපනය කර ක්‍රියාත්මක කරනු ලබන පළාත් පාලන ආයතන සංඛ්‍යාව	**100**		
6	මහජන උපයෝගීතා සංවර්ධනය උදෙසා ලබා දෙන ලද ණය පහසුකම් ලබා දෙන ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව			**56**
7	පළාත් පාලන ආයතන ණය පියවීමේ ප්‍රතිශතය	**92.5**		
8	පවත්වන ලද ප්‍රධාන ලේකම්වරුන්ගේ රැස්වීම් සංඛ්‍යාව		**75**	
9	විදේශ ආධාර ව්‍යාපෘති සඳහා පවත්වන ලද ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් සංඛ්‍යාව		**75**	
10	සිදු කරන ලද පර්යේෂන / අධ්‍යයන සංඛ්‍යාව සහ පවත්වන ලද ඇගයීම් සංඛ්‍යාව	**90**		

පරිච්ඡේදය 05- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු දක්වන්න

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කර තිබෙන "ශ්‍රීලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක නිර්ණායක - 2017" වාර්තාව පදනම් කරගෙන අදාල ඉලක්ක සහ නිර්ණායක වල අංක පහත වගුවට ඇතුළත් කර ඇති බව කාරුණිකව සලකන්න. තව ද , පදනම් දත්ත නොතිබීම හේතුවෙන් ජයග්‍රහණ වල ප්‍රගතිය මැන ගැනීමට නොහැකිවී තිබේ.

අනු අංකය	අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතියය		
				0%-49%	50%-74%	75%- 100%
1	**ඉලක්ක අංක . 1** සියලුම ස්ථාන ආවරණය කරමින් සියලු ආකාරයේ දුගීභාවය දුරලීම	**1.5**	**1.1.1,** **1.2.1,**			
2	**ඉලක්ක අංක . 2** සාගින්න අවසන් කර ආහාර සුරක්ෂිතතාවය සහ වැඩිදියුණු කළ පෝෂණය සාක්ෂාත් කිරීම සහ තිරසර කෘෂිකර්මය සඳහා අනුබල දීම	**2.1,** **2.2,** **2.3,** **2.4,** **2.a**	**8.3.1**			
3	**ඉලක්ක අංක 3** නිරෝගී ජීවිත තහවුරු කිරීම සහ සියලුම වයස් කාණ්ඩවල සියලු දෙනාගේ යහපැවැත්ම ඉහළ නැංවීම	**3.4,** **3.8,** **3.9,** **3.b**	**2.2.1,** **3.1.1,**			
4	**ඉලක්ක අංක 4** සියල්ල ඇතුළත් සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලීන ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම	**4.1,** **4.a,** **4.c**	**4.1.1,** **4.a.1,** **4.c.1**			

5	**ඉලක්ක අංක 5** ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇති කිරීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමුන් බලගැන්වීම	**5.5,** **5.c**				
6	**ඉලක්ක අංක 6** සියලු දෙනාට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් පැවතීම සහතක වීම	**6.1,** **6.3,** **6.b**	**6.1.1**			
7	**ඉලක්ක අංක 9** ඔරොත්තු දීමේ හැකියාව සහිත යටිතල පහසුකම් ගොඩනැගීම, සියල්ල ඇතුළත් සහ තිරසාර කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදන කෙරෙහි උනන්දු කරවීම	**9.1,** **9.c**				
8	**ඉලක්ක අංක 10** රටවල් තුළ සහ රටවල් අතර අසමානාත්මතාවය අවම කිරීම.	**10.2**	**1.4.1**			
9	**ඉලක්ක අංක 11** නගර සහ මානව ජනාවාස සියල්ල ඇතුළත්ව, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ තිරසාර බවට පත්කිරීම.	**11.2,** **11.6,** **11.7,** **11.a**	**10.7.2,** **12.4.2**			
10	**ඉලක්ක අංක 12** තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටා තහවුරු කිරීම	**12.4,** **12.5**	**1.5.3**			

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග සැකෙවින් විස්තර කරන්න

පදනම් දත්ත නොතිබීම හේතුවෙන් ජයග්‍රහණ වල ප්‍රගතිය මැන ගැනීම අපහසු වීම.

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත) **
ජ්‍යෙෂ්ඨ	35	25	10 / 2**
තෘතීයික	4	2	2
දිවිතියික	151	108	43
සුළු	63	56	7

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇතිනේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

අනුමත කාර්ය මණ්ඩලය නොමැති නිසා රාජකාරී කටයුතු නිසි පරිදී සිදුකිරීම බාධාවක්ව ඇත. කෙසේවෙතත් දැනට පවතින කාර්ය මණ්ඩලය කළමණාකරණය කිරීමෙන් ආයතනයේ ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

6.3 කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු. මී.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නමැනුම / ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
ප්‍රතිචක්‍රීකරණ කර්මාන්තය වැඩිදියුණුකිරීම සහ අපද්‍රව්‍ය කළමණාකරණ ප්‍රතිපත්තිය	01	2019.01.13 – 2019.01.19		$240	විදේශීය	මනා දැනුමක් ලැබිණි

දේශපාලනය තුළ කාන්තාව සහ සිවිල් සමාජය	01	2019.04.22 – 2019.05.10		$920	විදේශීය	මනා දැනුමක් ලැබිණි
සෙන්ට් ෆර්ටිලිටි කම්පැනි ලිමිටඩ්හි කම්හල් සංචාරය	01	2019.04.19 – 2019.04.21		$120	විදේශීය	මනා දැනුමක් ලැබිණි
JICA පළාත් පාලන දැනුම සම නිර්මාණ වැඩසටහන	01	2019.05.21 – 2019.06.29		$1200	විදේශීය	මනා දැනුමක් ලැබිණි
චීන දකුණු ආසියාතික සහයෝගීතා දෙවන සමුළුව	01	2019.06.09 – 2019.06.14		$450	විදේශීය	මනා දැනුමක් ලැබිණි
ආසියානු පළාත් පාලන ආයතන නිලධාරීන් සඳහා රැකියා ප්‍රතිපත්තිය පිළිබඳ ආරාධිත ධාරිතා සංවර්ධන වැඩසටහන	01	2019.06.08 – 2019.06.23		$600	විදේශීය	මනා දැනුමක් ලැබිණි
යාන්ත්‍රික “ ස්ක්‍රැ “ වර්ගයේ කොම්පෝස්ට් යන්ත්‍රRA - X) පරීක්ෂාව	01	2019.07.26 – 2019.07.31		$450 $742	විදේශීය	මනා දැනුමක් ලැබිණි
වඩාත් ඵලදායී පුද්ගලගත ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතියකට මාරු වීම සඳහා පහසුකම් සැලදීමට කොස්ටාරිකා හි පැවති දැනුම් හුවමාරු වැඩසටහන	01	2019.09.06 – 2019.09.16		$440	විදේශීය	මනා දැනුමක් ලැබිණි

Belt & Road construction & Advancement for Sri Lanka ශ්‍රී ලංකාවේ මාර්ග ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම	02	2019.10.10 – 2019.10.30		$880	විදේශීය	මනා දැනුමක් ලැබිණි
පාරිසරික සාධාරණත්වය සහ ආර්ථික උදෙසා නගර වඩාත් ක්‍රියාකාරී මෙන්ම සුහුරු බවට පත්කිරීම	01	2019.10.28 – 2019.10.31		$240	විදේශීය	මනා දැනුමක් ලැබිණි
පළාත් පාලන ආයතන හුවමාරු සහ සහයෝගීතා සම්මන්ත්‍රණය	01	2019.12.15 – 2019.12.21		$280	විදේශීය	මනා දැනුමක් ලැබිණි

පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		

1.3	ව්‍යාපාර හා නිශ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.5	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රිගත ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

2.8	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම(මු.රෙ 135)**			
3.1	මූල්‍යප බලතල ආයතන තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිළධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාකවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රෙල්ඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		

4.4	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව වසරේ ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදි පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රතිකාරව , සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රeකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		

8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිළදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රයලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත්කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර්ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රෙතල්ඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		

9.2	වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයකදී අපහරණය කිරීම	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රඛකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදුවාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමණාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රමකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රලකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රඛකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළතනිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		

11.2	මු.රෙ. 94(1) ප්‍රපකාරව සලසන ලද ප්‍රදතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ.		
12	රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිගහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රබකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සදහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රපකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රි.ම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුම් ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		

15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදයමට බැර කර තිබීම.	අනුකූල වේ.		
15.3	මු.රෙ. 176 අනුව භිග ආදායම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිළධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවියක් හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රතකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ.		

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	චක්‍රලේඛය අනුව 2019 වසරේදී ක්‍රියාත්මක කර නැත.	චක්‍රලේඛය අනුව 2020 වසරේදී ක්‍රියාත්මක කරනු ලැබේ.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ක ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් **මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම**			
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම			
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කොට තිබීම			

20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		